# ඉවරයක් කරමු

කොටි ත්‍රස්තවාදීහු ඊනියා සටන් විරාම ගිවිසුම අහෝසි කිරීම නිමිත්තෙන් කුඩා දරුවන් ඇතුළු විසිහත්දෙනකු මරා දමා තවත් විශාල පිරිසකට තුවාළ සිදු කළහ. කොටි මේ මරාදැමුවේ අහිංසක සිංහලයන් ය. ඔවුන් මියගියේ සිංහලයන් වීම නිසා මිස වෙනත් කරුණක් නිසා නො වෙයි. එහෙත් එපමණකින් ඇතැම් ව්‍යාජ උගතුන් දෙමළ ජනයා අසූ තුනේ ඝාතනය කිරීම දෙමළ ජනයාට දෙමළ වීම නිසා ම ඇති ප්‍රශ්නය කුමක් ද යන්නට පිළිතුරක් ලෙස ඉදිරිපත්කිරීම අනුගමනය කරමින් මෙය සිංහලයන්ට සිංහල වීම නිසා ම ඇති ප්‍රශ්නයක් ලෙස නො හඳුන්වමු. එහෙත් එකක් පැහැදිලිව කිව හැකි ය. කොටි සටන්කරන්නේ ආණ්ඩුවට විරුද්ධව පමණක් නො වෙයි.

කොටි සිංහලයන්ට විරුද්ධව ද සටන් කරති. කොටින්ගේ ප්‍රහාරයට සිංහලයන් ඉලක්ක වූ ප්‍රථම අවස්ථාව මෙය නො වෙයි. අවුරුදු ගණනාවකට පෙර කොටි පිටකොටුවේ බෝම්බ පිපිරෙව්වේ ද සිංහලයන්ට එරෙහිව ය. මේ ක්ෂණික කෝපය නිසා හෝ පිරිසක් එකතුවීම නිසා පිරිස් මනසින් හෝ කෙරෙන ප්‍රහාර නො වෙයි. කොටි සැලසුම් කර සිංහලයන් ඝාතනය කරති. සැලසුම් සහගත ව සිංහලයන්ට පහර දෙති. එහෙත් මෙහි දී සිංහල ජනයා නීතිය අතට ගත යුතු නො වේ. බුත්තල ඔක්කම්පිටියේ දුගී අසරණ සිංහලයන් ඝාතනය කිරීම ගැන කම්පාවන අතර කළයුත්ත හමුදාවට හා ආණ්ඩුවට පවරා අපි සන්සුන්ව කල්පනාවෙන් වැඩකළ යුතු වෙමු. අප දැනට කළ යුත්තේ මේ ප්‍රහාරය නිසා අසරණ වූ දරුවන් ජාතියේ ම දරුවන් ලෙස සලකා ඔවුන් හදාවඩා ගැනීම සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස්කිරීමත් වැඩිහිටියන් රැක බලාගැනීමට කටයුතු කිරීමත් ය.

සිංහලයන්ට විරුද්ධව ක්‍රියාකරන්නේ කොටි සංවිධානය පමණක් නො වෙයි. එක්සත් ජාතික පක්ෂය ද අද ක්‍රියා කරන්නේ සිංහලයන්ට විරුද්ධව ය. තමන්ගේ දෙමව්පියන් එ ජා පක්ෂයට ඡන්දය දුන් නිසා එ ජා පාක්ෂිකයන් වී සිටින ගිහියනුත් ගුරු හාමුදුරුවන් එ ජා පක්ෂයට හිතවත් වූ නිසා එ ජා පක්ෂයට තවමත් ඇදෙන භික්ෂූන් වහන්සේත් තම කාර්යභාරය ගැන නැවතත් සිතා බැලිය යුතු මොහොත පැමිණ ඇත. ශ්‍රී ල නි පක්ෂය නොතිබූ කාලයෙහි යම්කිසි ආකාරයකට හෝ ජාතිකත්වයක් පළවුයේ එ ජා පක්ෂයෙනි. ඒ බව උලුප්පා දැමීමට එකල මාක්ස්වාදීන්ගේ ක්‍රියාකලාපය ද හේතු විය. මාක්ස්ගේ නොවටිනා ඊනියා ජාත්‍යන්තර කම්කරු පංති සංකල්පය හිස් වූ හිස් මුදුනින් අවිචාරයෙන් පිළිගත් පුරෝගාමී මාක්ස්වාදීන්ගෙන් බහුතරය (පිලිප් ගුණවර්ධන මහතා යම් තරමකට හෝ මොවුන්ගෙන් වෙන් විය.) ලාංකේය විප්ලවයේ අපිකේන්ද්‍රය (එපිසෙන්ටර්) ලෙස සැලකුවේ වතුකරයේ දෙමළ කම්කරුවන් ය !. එවැනි පසුබිමක එ ජා පක්ෂයට නැති ජාතිකත්වයක් ද ආරෝපණය විය.

අද එ ජා පක්ෂය මුළුමනින් ම පෙනී සිටින්නේ බටහිරයන්ට අවශ්‍ය ආකාරයට ය. පක්ෂයට උපදෙස් ලැබෙන්නේ විජාතික බලවේගවලිනි. එ ජා පක්ෂයේ නායකත්වය අද මෙහෙයවනු ලැබෙන්නේ ලංකා සභා හෙවත් ඇංග්ලිකන් සභා සංස්කෘතියෙනි. මෙහි දී තිස්ස අත්තනායක මහතා රඟපාන්නේ තවමත් ඇතැම් ධනවත් නිවසක වැඩට සිටින ඊනියා බෝයි කොල්ලාගේ චරිතය ය. පක්ෂයේ තීරණ ගැනීමේ දී ඒ මහතාගෙන් කිනම් ප්‍රදානයක් සිදුවන්නේ ද? මහේෂ්වරන් ඝාතනය වෙනුවෙන් උද්ඝෝෂණ පාර්ලිමේන්තු වර්ජන ආදී ක්‍රියාකාරකම්වල නිරත වූ එ ජා ප නායකත්වය ඔක්කම්පිටියේ ඝාතනය ගැන කියන්නේ කුමක් ද? කරන්නේ කුමක් ද? මේ ලිපිය ලියන මොහොතවන තුරු අඩුම තරමින් ශෝකප්‍රකාශයක්වත් නිකුත්කිරීමට එ ජා ප නමින් පෙනී සිටින එක්සත් විජාතික පක්ෂය අසමත් වී ඇත. මින් මතුවට මේ පක්ෂය දැක්ම තීරුවෙහි හැඳින්වෙනු ඇත්තේ එ වි ප හෙවත් එක්සත් විජාතික පක්ෂය ලෙස ය.

එ වි ප ප්‍රකාශකිරීමට බලාපොරොත්තුවනු ඇත්තේ මේ සියල්ලට ම වරදකරුවා ආණ්ඩුවත් ඔවුන් කියන අන්දමට ආණ්ඩුව සිරභාරයට ගෙන ඇති ජ වි පෙ සහ ජා හෙ උරුමයත් බව ය. ශ්‍රී ල නි ප, ජ වි පෙ, ජා හෙ උ සහ ම එ පෙ මොන දුර්වලකම් තිබුණත් පනස්හයේ දරුවන්ගේ පක්ෂ වෙයි. ශ්‍රී ල නි පක්ෂයේ න්‍යාය පත්‍රය වෙනස්කිරීමට විජාතික බලවේග මොන තරම් උත්සාහ දැරුව ද ඔවුන් අසාර්ථක වී ඇත. විජාතික බලවේග අවසන් වරට යොදාගත් තුරුම්පුව වූ චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය අද වන විට ආපසු නැවතත් ඇගේ නිජබිම වූ එංගලන්තයට ගොස් ඇත. ඒ සියල්ල මැද විජාතික බලවේග අද පසුවන්නේ සිංහලයන්ට, විශේෂයෙන් ම සිංහල බෞද්ධයන්ට, එරෙහිව දරාගත නොහැකි වෛරයකින් ය.

© Prof. Nalin De Silva

එ වි ප හා ඊනියා ප්‍රබුද්ධයන්, ජනමාධ්‍යවේදීන් ලෙස පෙනී සිටින ජඩමාධ්‍යවේදීන් බටහිරයන් ඇතුළු අනෙක් විජාතික බලවේග කියනු ඇත්තේ ඊනියා සටන් විරාම ගිවිසුම අහෝසි නොකරන්නට මේ ඝාතන සිදු නොවීමට තිබුණු බව ය. සටන් විරාම ගිවිසුම අහෝසි කරනු ලැබුයේ කොටි සංවිධානය විසිනි. ලක්ෂ්මන් කදිරගාමර් ඝාතනය, ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් ගෝඨාභය රාජපක්ෂ ඝාතන තැත, හමුදාපති සරත් ෆොන්සේකා ඝාතන තැත, හමුදා නිලධාරී ඝාතන පමණක් නොව කැබිතිගොල්ලෑව ඝාතන ආදිය ද කෙරුණේ විජාතික බලවේගවලට අනුව ඊනියා සටන් විරාම ගිවිසුම ක්‍රියාත්මක වූ කාලයෙහි ය. කොටි ඊනියා සටන් විරාම ගිවිසුමෙන් ඉවත් වූ පසු ද ඔවුහු නිල වශයෙන් ඒ බව ප්‍රකාශ නො කළහ. නෝර්වේ නියෝජිතයන් ඇතුළු ව්‍යාජ සටන් විරාම නිරීක්ෂකයෝ ද නො ඇසූ කන් හා නො පෙනෙන දෙනෙත් ඇතිව සිටිය හ. ඔවුන් සටන් විරාමය පසෙක තබා තානායම්වල හා හෝටල්වල වෙනත් නිරීක්ෂණ කටයුතුවල යෙදුණු බවට වාර්තා වෙයි.

අවසානයේ දී ආණ්ඩුව නිල වශයෙන් තමන් මේ ව්‍යාජ ගිවිසුමෙන් ඉවත්වන බව ප්‍රකාශ කෙළේ ය. බටහිරයන්ගේ ප්‍රභාකරන් හා රනිල් වික්‍රමසිංහ නම් ප්‍රධාන නියෝජිතයන් අතර වූ ද්‍රෝහී ගිවිසුම කොටි විසින් ම උල්ලංඝනය කෙරෙන විට මුවින් නොබැණ සිටි එ වි ප ආණ්ඩුව නිල වශයෙන් ගිවිසුමෙන් ඉවත් වූ බව ප්‍රකාශ කිරීමත් සමග දුම්මල ගත් ආචාර්යයකු මෙන් ක්‍රියාකිරීමට පටන් ගත්තේ ය. ඊනියා සටන් විරාම ගිවිසුම කොටි විසින් උල්ලංඝනය කරනු ලැබ තිබුණත් නැතත් අහෝසි කළ යුතුව තිබුණි. ඒ ගිවිසුම එතරම් ම ද්‍රෝහී ගිවිසුමකි. කොටි ගිවිසුම උල්ලංඝනය කිරීමෙන් පසුව තවදුරටත් බොරුවට නෛතික ව ඒ පවත්වාගෙන යෑමේ තේරුමක් නැති විය.

කොටි තැන තැන බෝම්බ පුපුරවන්නේ ඊනියා සටන් විරාම ගිවිසුම අහෝසිකිරීම නිසා නො වෙයි. ඔවුන් එ වි ප, ජඩමාධ්‍ය, බටහිර තානාපති කාර්යාල සමග එකතු වී එවැනි මතයක් ප්‍රචාරය කිරීමට සූදානම් වනු ඇත. එහෙත් සිංහලයන් මේ බොරු ප්‍රචාරවලට රැවටිය යුතු නො වෙයි. කොටි අද බෝම්බ පුපුරවන්නේ තම පරාජය අබියස වියරුවෙනි. අද කළ යුත්තේ එක් දෙයක් හා එක් දෙයක් පමණකි. ඒ හැකි ඉක්මණින් කොටි ත්‍රස්තවාදීන්ගේ කටයුතු ඉවරයක් කිරීම ය. වෙනත් වචනවලින් කිවහොත් කොටි සමූලඝාතනය කළ යුතු වෙයි.

හැකි ඉල්මණින් ඒ කළ යුතු ය. එයට සමහර විට අවුරුද්දකට වඩා කල්ගත වනු ඇත. අවුරුද්දකට අඩු කාලයකින් ඒ කළහැකි නම් ඉතා යහපත් වෙයි. එහෙත් එයට වඩා කල්ගත වුව ද ඒ කළ යුතු වෙයි. වෙනත් විකල්පයක් අපට කිසි දා නො තිබිණි. ඊනියා සාකච්ඡා, දේශපාලන විසඳුම් ආදිය විජාතික බලවේග විසින් අප මත බලයෙන් පටවනු ලැබූ දේ ය. එහි දී බටහිරයෝ තම දැනුම් ආධිපත්‍යය යොදාගනිමින් අප මෙල්ල කිරීමට, නොමග යැවීමට උත්සාහ කළහ. ඔවුහු ඒ සඳහා රිසි සේ මුදල් වියදම් කළහ. ව්‍යාජ උගතුන්ට විශ්වවිද්‍යාලවල ඉගැන්වීමට පාඨමාලා සැපයූහ. ඒ පාඨමාලා ඉගැන්වීමට රාජ්‍ය නොවන ආයතන ඔස්සේ ප්‍රතිපාදන, විදේශ සංචාර, තරු පහේ හෝටල්වල මගඩි සම්මන්ත්‍රණ සංවිධානය කළහ. බටහිර ඇංග්ලිකන් සභා සංස්කෘතියේ නියෝජිතයකු වූ ද සිංහල බෞද්ධ විරෝධියකු වූ ද කුමාර් රූපසිංහ වැන්නෝ එහි නායකත්වය දැරූහ. මේ අතර තමන් ද මහා ජගතුන් ලෙස සිතා සිටින ව්‍යාජ උගත් පඹයෝ ඊනියා මානව අයිතිවාසිකම් ආදී කසිකබල් සංකල්ප යොදාගනිමින් කොටි ත්‍රස්තවාදීන් වෙනුවෙන් පෙනී සිටිය හ.

කොටි පරාජය කළ හැකි බව වීරෝදාර හමුදාව විසින් පෙන්නුම් කෙරී ඇත. අවුරුදු ගණනාවකට ඉහත දී ඒ කළ හැකිව තිබුණි. එහෙත් ඒ වැළැක්වූවෝ එ වි ප, බටහිර බලවේග, ජඩමාධ්‍යවේදීහු, පඹ උගත්තු, ආදීහු ය. ඔවුහු අනභිබවනීය කොටි බිල්ලකු මැවූහ. ඔවුහු කොටි ඉතා ශක්තිමත් බවත් හමුදාවට ඊනියා ගරිල්ලන් පැරදවිය නොහැකි බවත් කීවෝ ය. ගෙදර සිට ආරක්ෂක තත්වය ගැන ඉංගිරිසියෙන් ලියන ඊනියා යුද විශාරදයෝ හමුදාවේ ධෛර්‍යය (මොරාල් - මානසික ගැන්ම) නැතිකරන වල්බූත ලිවූහ. ඊනියා නීති විශාරදයෝ මාර්ග බාධක හා සෝදිසිකිරීම්වලට එරෙහිව ව්‍යාජ මානව අයිතිවාසිකම් තර්ක ඉදිරිපත් කළහ. මොවුන් නොවන්නට කොටි වැළලූ තැන්වල මේ වන විට ගස් වැඩී බොහෝ කල් ය. එහෙත් මොවුහු විවිධ උපක්‍රමවලින් කොරි පවත්වාගෙන ගියහ. කොටි අද බෝම්බ පුපුරවන්නේ එසේ කොටින්ට ඉඩ දුන් බැවින් ය. බුත්තල ඝාතනවලට මොවුහු ද වගකිවයුත්තෝ වෙති.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva